මීට අමතරව අද වන විට තිරිඟු පිටි මිල ඉහළ යනවිට ජනතාවට තිබූ එකම විකල්පය වූ සහල්ටික සත්ත්ව ආහාර බවට හැරවීමේ ද්‍රෝහී වැඩ පිළිවෙලක් ද පසුගිය කාලයේ ක්‍රියාත්මක වී තිබේ. එසේම ආහාර බෝග ජීව ඉන්ධන බවට හැරවීම, ජීව ඉන්ධන සඳහා ආහාර වගා බිම් යොදා ගැනීමේ ගෝලීයව මට්ටමේ මතුවන ප්‍රවනතාවට එරෙහිවීමට කාලය පැමිණ ඇත.

ජනතාවගේ කුස ගින්න තමන්ගේ දේශපාලන ව්‍යාපෘති තර කර ගැනීමට කැස කවන සියළු ප්‍රචාරක උපක්‍රම අප දැඩි පිළිකුලෙන් යුතුව හෙලා දකින්නේ ඉහළ යන ජීවන වියදම ඇතුළු ව්‍යසනවලට ඔවුන් ද වග උත්තර කරුවන් වන බැවිනි. පසුගිය විසි වසරකට අධික කාලය පුරාවට මොවුන්ගෙන් කිසිවෙකු හෝ ජීවන වියදම අඩු කොට ඇද්ද බලය ලබා ගන්නා තෙක් පුරසාරම් දොඩා බලය ලබා ගත් පසු තමන් ඊට අසමත් බව හොදින් ඔප්පු කොට තහවුරු කොට ඇත.

සියලු ප්‍රදර්ශනාත්මක, ප්‍රචාරාත්මක ව්‍යාපෘති වලට වැය කරන මුදල් සත්‍ය වශයෙන්ම ජනතාවගේ ආහාර අයිතිය සුරැකීමට රට තුළ ආහාර සුලබ කිරීමට වැය කළ යුතු අතර ඒ සඳහා පක්ෂභේදයකින් තොරව ජනතාවගේ සහය ලබා ගැනීමට නම් කඩා විසිරුවා හැර ඇති වාරිමාර්ග සත්ත්ව පාලන හා කෘෂිකර්මය සම්බන්ධ දෙපාර්තමේන්තු එක් අමාත්‍යාංශයක් යටතට ගෙන කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන වැඩ පිළිවෙළක් සියලු නිලධාරීන්ගේ අවනත භාවය සහිතව දියත් කළ යුතු ඇත. එවන් නිසි වැඩ පිළිවෙලක් නොමැතිව අසාර්ථක වූ අතීත සියලු ව්‍යාපෘති ගොන්නට රට කුස ගින්නේ මුදා ගැනීමේ ව්‍යාපාරය ද ගොදුරු වීම මහත් ව්‍යසනයකට හේතු වනු ඇත.

පාරිභෝගික ජනතාව වශයෙන් අපි විචිචූරණ වගාවන් පසෙකලා අපේ ආහාර බෝග වගාවට මුල් තැන දී ඉතිරිව තිබෙන සෑම ඉඩක්ම ඒ සඳහා වෙන් කර ගැනීමට වෙහෙසෙමු !


ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය
අංක 09, පළමු පටුමග, වනාත පාර, ගංගොඩවිල, නුගේගොඩ.
Tel : + 94 - (0)11- 2817156 Fax : + 94 - (0)11- 4305274 Web: www.greensl.net E -Mail: office@greensl.net


# සෞඛ්‍යාරක්ෂිත ආහාර අයිතිය වෙනුවෙන් පෙළගැසෙමු !

වර්තමානයේ දේශගුණ විපර්යාසය නිසා ආහාර හිඟයෙන් පීඩා විඳින අප එයටත් වඩා කුරිරු සැලසුම් සහගත ආහාර හිඟය, අහේනිය හා සාගතය පරදවා අපේ උරුමය රැක ගැනීමට සියළු දෙනාම පෙරමුණ ගැනීමේ කාලය එළඹ ඇත. සියළු සත්ත්වයෝ ආහාරය මත යැපෙති. ඉනුත් මිනිසුන් තමන්ගේ ආහාරය තමන් විසින්ම වවාගෙන කති. බඩගින්නට ජාති, ආගම්, කුල, පක්ෂ, පාට, දේශපාලනය, දේශසීමා ආදී කිසිදු භේදයක් නැත.

එහෙත් මුළු ලෝකයේම බලවත් රටවල් බඩගින්න තම තමන්ගේ දේශපාලන ව්‍යාපෘතීන් තර කර ගැනීමට යොදාගෙන ඇත. ඉන් ද මහත් ඵල ලබන්නේ මහාපරිමාණ බහුජාතික කොම්පැනි කාරයෝය. දේශපාලකයෝ තමන්ගේ දැලට හසුකරගත් ජාවාරම්කාරයින් මුළු ලෝකයේම ආහාරය පිළිබඳ අණසක පතුරවමින් ග්‍රහනය තරකොට ඇත.

ඕනෑම රටක ජනයා තමන්ට අවශ්‍ය ආහාර පාන, පළතුරු නිපදවීමට හෝ මිළදී ගැනීමට ඇති හැකියාව ආහාර සුරක්ෂිතතාව නමින් හැඳින්වේ. තමන් කන්නේ බොන්නේ මොනවාදැයි ස්වධීනව නිදහස්ව තීරණය කිරීමට ජාතියකට ඇති අයිතිය ආහාර ස‌ෛවරීභාවය ලෙස හැඳින්වේ. අද ලංකාවට මේ දෙකම නැත. කන්නේ අනුන්ගේ රටක නිපදවන ධාන්‍යයක රොඩ්ඩය. ඒ පාන් පිටිය. බොන්නේ වෙනත් රටක නිපදවන කිරිපිටිය. ඒවායේ මිල එහා මෙහා යන්නේ අපේ උවමනා හා අවශ්‍යතා සලකා නොවන අතර එම රටවල සමාගම්වල හා එහි කොටස්කරුවන්ගේ උවමනා හා අවශ්‍යතා සලකා ගෙනය.

දේශපාලන බලය තීරණය කරන ලොව ප්‍රධාන වෙළඳාම් පහක් ගැන කියැවේ. ඒවා ආයුධ, ඛණිජ තෙල්, බෙහෙත්, පාන්පිටි හා කිරිපිටිය. මේ පංච මහා වෙළඳාමේ ග්‍රහණය කෙතරම් කුරිරු ද, දරුණු ද කියා ලංකාවේ කිසිවෙකුට

අමුතුවෙන් කියා දිය යුතු නොවේ. මේ මොහොත වන විට ලංකාවේ ජනයා මේ ග්‍රහනයේ හපයක් බවටම පත්ව තිබීම ගැන කිසිවෙකුගේ ගැඹුරු අවධානයට යොමුව නැතැයි අපට සිතේ.

පසුගිය තිස් වසර පුරා කෙමෙන් අපව නැවෙන් කටට වැටෙන තුරු බලා සිටින නිවට ජාතියක් බවට පත්කොට තිබේ. දේශීය ආහාර පාන වල දොස් ගැනම කථා කරමින් ඒවා මහා භයානක විෂ සහිත ලෙඩ  රෝග වැඩෙන පෝෂණ ගුණයෙන් හීන දේවල් බවට කථා පතුරවමින් නිළියන්, ක්‍රීඩකයන් යොදා ගනිමින් මාධ්‍ය හරහා ජනප්‍රිය කෙරෙණු කිරිපිටි, කෝලා වර්ග, පාන් පිටි හා කෘත්‍රිම තාක්‍ෂණික රසායනික ක්‍ෂනික ආහාර තමන්ගේ ජීවිතය බවට පත් කර ගැනීමට මෙරට ජනයා කෙමෙන් හුරු විය. ඒවා ප්‍රචලිත වන පරිදි ළමා, තරුණ, වැඩිහිටි යන සමාජ ස්ථර ග්‍රහණය වන ප්‍රචාරක දැන්වීම්, ටෙලි නාට්‍ය ආදිය නිපදවා ජන ජීවිතයට බද්ධ කිරීමට සමාගම් සමත් වී තිබේ. තම සමාගම් වුවමනා ඉටු නොවන විට අවශ්‍ය නම් රාජ්‍ය පාලනය පවා වෙනස් කිරීමට ඔවුන් සූදානම්ය. දේශපාලන, රාජ්‍ය නිලධාරී, මාධ්‍ය ආදී සියළු ක්ෂේත්‍රයන් නිල නොවන ලෙස තම වෙළඳ ආධිපත්‍යයේ ග්‍රහණයට නතු කර ගැනීමට ඔවුන්ට හැකියාව ලැබී ඇත.

ආහාර සෛවරීභාවයේ උරුම කරුවන් වූ අප යටත් විජිතවාදීන්ගේ ඉඩම් මංකොල්ලයත් වෙළඳ වතු වගාවන් පැතිරවීමත්, සුදු සහල්, තිරිඟු පිටි, සුදු සීනි ආදිය ආහාරයට හුරුකොට අපේ ආහාර උරුමය දිය කොට නැවෙන් කටට එනතුරු බලා ඉන්න තත්ත්වයකට පත් කොට ඇත.

නිදහසින් පසු අපේ පාලකයන් ආහාර සැපයීම වැඩි කිරීමට ප්‍රමාණාත්මකව විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කල ද ඒවායේ අවසාන ප්‍රථිඵලය දෙස බලන විට ඒවායෙන් ලද වාසි මුදලින් ගිනිය හැකි වුවද පරිසරයටත් ජීවීන්ටත් සිදුවූ හානිය කිසිසේත් මුදලින් ගැනිය නොහැකි ලෙස මුළු රටේම පරිසර සම්පත් කාබාසිනියා කිරීමටත් ණය උගුලේ හිරවීමත් පසු ගිය දශක තුළ කාන්තාවන්ගේ නීරක්තිය ඉහල යෑමත් ළදරු, ළමා, වැඩිහිටි මන්දපෝෂණය ඉහල යාමත් උග්‍ර වී ඇති අතර ජනතාවගෙන් බහුතරය සුවකළ නොහැකි රෝගාබාධවලින් පෙලෙන්නන් සහ හඳුනා නොගත් රෝගවලින් පෙළෙන්නන් බවට පත් වූ නිසා අවසාන ඵලය බහුජාතික ඖෂධ සමාගම්වල පහසු ගොදුරු බිමක් බවට පත්වීමත් බහුතරයක් බෙලහීන ජාතියක් බවට පත්වීමයි.

පසුගිය දශක තුනක කාලය තුළ මාධ්‍ය හා බහු ජාතික කිරිපිටි කොම්පැනි කාරයෝ එකතුව කිරිපිටි අත්‍යවශ්‍ය භාණ්ඩයක් බවට ජනතාව මිත්‍යාවෙන් මුලාකොට තම ග්‍රහනයට නතුකරද්දී දශ ලක්‍ෂයකට අධික කිරි හරකුන් මරා මස් කරද්දී පාලකයින් මුණිවත රැක්කේය. මේ රටේ ජනතාවට ආහාර සැපයීමට ලෝකෙට ණය වී තැනූ බහු කාර්ය යෝජනා ක්‍රමවල කෙත්බිම්වල මෙරට පරිසරය කාබාසිනියා කරන විදේශිකයින්ට අවශ්‍ය ආහාර නිපදවීම සහ සත්ත්ව ආහාර නිපදවීමට යොදා ගත්හ.

කංකුං මීටියේ සිට සියල්ල රටින් ගෙනෙන්නට විවෘත ආර්ථික දොර ඇරදී ඉතිරිව තිබූ ආහාර අභිමානයද දියවෙන්නට ඉඩදී බලා සිටියෝය. ජනතාව ලෙඩ කරවන කෘත්‍රිම තාක්‍ෂණික, රසායනික, ක්‍ෂණික ( Fast food ) හා ජාන විකෘති ආහාර පාන මාධ්‍ය හරහා ජනතාවගේ ආහාර රටාව තුළට රිංගවා තමන්ගේ මඩිය තර කර ගන්නට රටේ කොම්පැනි කාරයන් විවිධ උපක්‍රම යෙදීය.

විකෘති ආහාර රටාවකට හුරුවීම නිසා අනාදිමත් කාලයක සිට කොස්, දෙල් වලට අල, බතල වලට සොබාදහම මහා කරුණාවෙන් නොමිලේ ලබා දෙන ආහාර වලට තිබුනු බැඳීම් දියකර හරිනතෙක් ලැබෙන අස්වැන්න යම් කොටසක් අනාගතයේ තමන්ගේ ප්‍රයෝජනයට තබාගත් ගොවියා ණය හිලව්වට සියල්ල විකුණාදමා ඉතිරි කාලය වියදම් පියවා ගැනීමට කුලීකරුවන් ලෙසත් මැද පෙරදිග වහල් සේවයට, වෙළෙඳ කළාප වලට බිරිඳ, දුව පිටත්කරන තැනටත් පුතුන් ගොවි බිම් අතහැර වෙනත් රැකියා වලට යවන තැනට පත්වෙන්නට ඉඩ හැර සුසුම් ලන තත්ත්වයට පත් කළේය.

ඉන්ධන, කිරි පිටි, පාන් පිටි සහ සියළු ආහාරපාන හා එදිනෙදා වියදම් ඉහල යන විට ඉදිරියට පැමිණ කෑ ගැසූ කිසිඳු දේශපාලනඥයෙකුට බලය ලැබුණු පසු මිල අඩු කිරීමට නොහැකි විය. 1994 වසරේ රු 3.50 ට පාන් දෙන්නට පොරොන්දු වී එය ඉටු කළේය. ඒ අවස්ථාවේ ඇති වුණු ජනප්‍රිය රැල්ලට මේ සමාගම් ද අඩු වැඩි ලෙස හවුල් වී එය ඉටු කිරීමට සහය විය. එය සහනාධාරය කෙළෙවර වූයේ දශකයක් තුළ පාන් මිල පස් ගුණයකින් වැඩි වී අද වන විට එය දස ගුණයකටත් වඩා වැඩි වීම උදාහරණයක් පමණි.